අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය
IFLA වෘත්තීය වාර්තා, අංක 92

# සිරකරුවන් සඳහා වූ පුස්තකාල සේවා පිළිබඳ මාර්ගෝපදේශ

3 වන සංස්කරණය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# සිරකරුවන් සඳහා වූ පුස්තකාල සේවා පිළිබඳ මාර්ගෝපදේශ

3 වන සංස්කරණය

අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය
IFLA වෘත්තීය වාර්තා, අංක 92

# Guidelines *for* Library Services to Prisoners

3rd Edition

Vibeke Lehmann
Joanne Locke

---

# සිරකරුවන් සඳහා වූ පුස්තකාල සේවා පිළිබඳ මාර්ගෝපදේශ

3 වන සංස්කරණය

පරිවර්තනය
ප්‍රේමිලා ගමගේ
සුනිල් වලිමුනි

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ පුස්තකාල විද්‍යා ප්‍රකාශන පළ කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රකාශිතයි.

# සිරකරුවන් සඳහා වූ පුස්තකාල සේවා පිළිබඳ මාර්ගෝපදේශ

3 වන සංස්කරණය

පරිවර්තනය

© ප්‍රේමිලා ගමගේ (Ph.D.UK) | සුනිල් වලිමුනි

මුද්‍රණය - ප්‍රථම මුද්‍රණය 2020

ISBN 978-955-7544-35-9

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අනුමැතිය ලද ප්‍රකාශනගත සූචිකරණ දත්ත**

ලෙහ්මන්, විභේක්
සිරකරුවන් සඳහා වූ පුස්තකාල සේවා පිළිබඳ මාර්ගෝපදේශ / විභේක් ලෙහ්මන් සහ ජොආන් ලොක්; පරිවර්තනය ප්‍රේමිලා ගමගේ / සුනිල් වලිමුනි විසිනි. - කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2020
පි. 50; සෙමී. 21
"Guidelines for library services to prisoners" කෘතියේ පරිවර්තනයකි.

i. 027.665 ඩිවි 23 ii. ලොක්, ජොආන් (සම කර්තෘ)
iii. ගමගේ, ප්‍රේමිලා (පරි.) iv සුනිල් වලිමුනි (පරි.)

1. සිරකරු පුස්තකාල - ප්‍රමිති
2. සිරකරුවන් - පොත් සහ කියවීම්

**පරිගණක සංයෝජනය/පිටු සැකසුම/මුද්‍රණය**

නියෝ ග්‍රැෆික්ස් (පුද්) සමාගම
44, උඩහමුල්ල දුම්රියපළ පාර, ගංගොඩවිල, නුගේගොඩ.

**ප්‍රකාශනය**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත, කොළඹ 07.
0112 698847 / 0112 685197

| | |
|---|---|
| Title | : Guidelines for library services to prisoners |
| Author | : Vibeke Lehmann and Joanne Locke |
| Translator | : Premila Gamage and Sunil Walimuni |
| Publisher | : National Library and Documentation Services Board<br>14, Independence Avenue, Colombo 07, Sri Lanka |
| ISBN | 978-955-7544-35-9 |
| Price | : LKR 250.00 |
| Pages | : 50 |
| Printed By | : Neo Graphics (Pvt) LTD.<br>44, Udahamulla Station Road, Nugegoda. |

# පටුන


පූර්විකාව vii

ස්තුතිය ix

හැඳින්වීම xi

අභිමතාර්ථය xi

පසුබිම xii

දර්ශන සහ උපකල්පන xv

මාර්ගෝපදේශය 1

1. විෂය පථය 1
2. පරිපාලනය 1
3. ප්‍රවේශය 3
4. භෞතික පහසුකම් සහ උපකරණ 5
5. තොරතුරු තාක්‍ෂණය 7
6. කාර්ය මණ්ඩලය 8
7. අයවැය 11
8. පුස්තකාල ද්‍රව්‍ය 12
9. සේවාවන් සහ වැඩසටහන් 18
10. සන්නිවේදනය සහ අලෙවිකරණය 20

ශබ්ද මාලාව 23

ග්‍රන්ථ නාමාවලිය 25

# පූර්විකාව

රටක සමාජයක සාමාන්‍ය පුරවැසියන් සඳහා තොරතුරු දැනගැනීම මෙන්ම තොරතුරු ලබා ගැනීම සඳහා වන අයිතිය ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන සෑම රටකම සිය මූලික නීතිය මගින් ස්ථාපිත කර තිබේ. මෙම මූලික අයිතිවාසිකම එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය මගින් ද තහවුරු කර තිබේ. තොරතුරු ලබා ගැනීමේ කාර්යයේ දී මෙන්ම තොරතුරු ලබා දීමේ කාර්යයේ දී ද ජනමාධ්‍යවලට ප්‍රමුඛ ස්ථානයක් හිමි වුවත් තැන්පත් කර තිබෙන තොරතුරු ලබා ගැනීම සඳහා පහසුම ස්ථානය වන්නේ පුස්තකාලයයි. වර්තමාන තොරතුරු සමාජය තුළ පාඨක අවශ්‍යතා අනුව විවිධ ස්වරූපයේ පුස්තකාල නිර්මාණය වී තිබේ. මෙම පුස්තකාල සාම්ප්‍රදායික රාමුව තුළ ස්ථාපිත පුස්තකාල ලෙස ද නම් කළ හැකිය. කෙසේ වුවද මෙම සාම්ප්‍රදායික පුස්තකාල රාමුවෙන් බැහැරව පුස්තකාල සේවා අපේක්ෂාවෙන් සිටින වරප්‍රසාද නොලත් කණ්ඩායම්ද සමාජය තුළ හඳුනාගත හැකිය. එවැනි කණ්ඩායම් අතර රෝහල් සහ බන්ධනාගාරගත ශ්‍රවණාබාධිත හා දෘශ්‍යාබාධිත පුද්ගලයින්, සාත්තු නිවාස හා ළමා නිවාස දරුවන්, නිවසට සීමා වූ පුද්ගලයන්, කියවීමේ අපහසුතා සහිත පුද්ගලයන් ආදීන් හඳුනාගත හැකිය.

අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය (IFLA) මගින් මෙලෙස ප්‍රජාවක් තුළ සිටින සාම්ප්‍රදායික පුස්තකාල සේවා අත්විඳීමට අපොහොසත් කණ්ඩායම් වෙනුවෙන් සේවා සැපයීම සඳහා අවවරප්‍රසාදිත පුද්ගලයින්ට සේවා සපයන පුස්තකාල අංශය (Libraries Serving Disadvantaged Persons - LSDP) ස්ථාපිත කළ අතර මෙම ඒකකයේ ස්ථාවර කමිටුව විසින් 1985

වසරේදී බන්ධනාගාර පුස්තකාල ක්‍රියාකාරී කමිටුවක් පිහිටුවන ලදි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය මගින් 1992 වසරේදී සිරකරුවන් සඳහා වූ පුස්තකාල සේවා පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාශයට පත් කරන ලදි.

මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශ්ව ප්‍රකාශනයට අනුව සාපරාධි යුක්තිය සහ සිරගත කිරීම සම්බන්ධයෙන් නූතන සමාජය වඩාත් කාරුණික හා ප්‍රායෝගික භාවිතාවන් අනුගමනය කරන බැවින් සිරකරුවන්ට ද දඬුවම් ලබා දීම වෙනුවට අධ්‍යාපනය, පුනරුත්ථාපනය මෙන්ම කාලය ඵලදායි ලෙස භාවිත කිරීම වැනි ක්ෂේත්‍ර කෙරෙහි යොමු කිරීමට ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ. ඉගෙනීමට හා තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය සිරගත කර ඇති පුද්ගලයෙකුට අහිමිකර නැති අතර නිදහස් ලෝකයේ පුස්තකාලයකින් ලබා දෙන සේවා බන්ධනාගාර පුස්තකාලයකින් ද ලබාදිය හැකිය. පුස්තකාලය යන්න බාහිර ලෝකයට කවුළුවක් විවර කරන ස්ථානයක් වන අතර, බාහිර ලෝකයට නිදහස්වීමට සූදානම්වන පුද්ගලයින්ට එය බෙහෙවින් ඵලදායි වනු ඇත.

අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය මගින් ප්‍රකාශිත මෙම මාර්ගෝපදේශ සංග්‍රහය ලොව විවිධ රටවල භාෂා ගණනාවකට පරිවර්තනය වී තිබෙන අතර මෙය සිංහල භාෂාවට පරිවර්තනය වීම මගින් මෙරට බන්ධනාගාර ක්ෂේත්‍රයේ නිලධාරීන්ට මෙන් ම ප්‍රතිපත්ති තීරකයන්ටත්, මේ පිළිබඳ උනන්දුවක් දක්වන පුස්තකාල වෘත්තිකයන්ටත්, පර්යේෂකයන්ටත් ප්‍රයෝජනවත් මාර්ගෝපදේශ සංග්‍රහයක් වනු නො අනුමානය.

**සොනාල ගුණවර්ධන**
**සභාපති**
**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**

## ස්තූතිය

මෙම ප්‍රකාශනයේ අන්තර්ගතය සඳහා ඔවුන්ගේ වටිනා අදහස් සහ යෝජනා ලබා දුන්, අවවරප්‍රසාදිත තත්වයට පත් වූ පුද්ගලයින් සඳහා වූ පුස්තකාල පිළිබඳ ස්ථාවර කමිටුවේ සාමාජිකයින්ට, කතුවරු ස්තූතිය පුද කරති. ඔවුන්ගේ රටවල බන්ධනාගාර පුස්තකාලවල සහ බන්ධනාගාර පුස්තකාල නීතිවල තත්ත්වය පිළිබඳ ප්‍රශ්නාවලියට ප්‍රතිචාර දැක්වූ රටවල් 25කට වඩා වැඩි ගණනක පුස්තකාලාධිපතීන්ට ද අපේ හෘදයාංගම ස්තූතිය පළ කරමු. කටුක හා දණ්ඩනීය තත්වයේ සිට කාරුණික හා පුනරුත්ථාපනීය තත්වයන් දක්වා වූ පරාසයක් යටතේ දඬුවම් විඳින සිරකරුවන්ට මූලික තොරතුරු සහ කියවීමේ සේවාවන් ස්ථාපනය කිරීමට වෙහෙසෙන පුස්තකාල වෘත්තිකයන් තවමත් මුහුණ දී ඇති බොහෝ අභියෝග පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට කතුවරුන්ට මෙම තොරතුරු ඉතා ප්‍රයෝජනවත් විය.

බොහෝ ප්‍රතිචාර විමර්ශනය කිරීමෙන් පසු, කතුවරුන්ට තදින් ම පෙනී ගියේ බන්ධනාගාර පුස්තකාල සඳහා වූ මාර්ගෝපදේශ පිළිබඳ නව සංශෝධිත ප්‍රකාශනයක් පළ කිරීම ඉතා අවශ්‍යව ඇති බවයි.

අවසාන වශයෙන්, බන්ධනාගාර පුස්තකාල මාර්ගෝපදේශක ක්‍රියාකාරී කණ්ඩායමේ සාමාජිකයින්ටත්, සාහිත්‍ය ගවේෂණ සිදු කරමින් හා විවේචනාත්මක අදහස් හා ධනාත්මක යෝජනා ඉදිරිපත් කළ බර්ගිටා ඉර්වෝල් සහ මරියා ජෝසේ ලෝපේස්-හියුර්ටෙස් පෙරේස්ටත් අපගේ කෘතඥතාව හිමි වේ.

# හැඳින්වීම

## අභිමතාර්ථය

මෙම ලේඛනයේ අභිමතාර්ථය වන්නේ සිරකරුවන්ට පුස්තකාල සේවා සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම සඳහා මෙවලමක් සැපයීමයි. බන්ධනාගාර පුස්තකාල සඳහා ජාතික මාර්ගෝපදේශ පිළියෙල කිරීමේ දී මෙම ලේඛනය ආදර්ශ මාර්ගෝපදේශයක් ලෙස භාවිතයට ගැනීම අපේක්ෂා කෙරේ. දේශීය තත්වයන් පිළිබිඹු වන ආකාරයට එය ඉතා පහසුවෙන් අනුවර්තනය කර ගත හැකියි. ඒ සමගම, බන්ධනාගාර පුස්තකාල පවත්වා ගැනීම පිළිබඳ ව ජාතික හා ප්‍රාදේශීය ආණ්ඩුවල ප්‍රතිපත්තිවලින් සහාය දක්වන බොහෝ රටවල පුස්තකාල සේවාවන් හි පිළිගත හැකි මට්ටමක් පිළිබිඹු කිරීමට මෙම ජාත්‍යන්තර මාර්ගෝපදේශ යොදා ගත හැකි වේ. නව පුස්තකාල සැලසුම් කිරීම හා පවත්නා පුස්තකාලයන් ඇගයීම සඳහා ද මෙම මාර්ගෝපදේශ මෙවලමක් සපයයි. දේශීය මාර්ගෝපදේශ හෝ ප්‍රමිති කිසිවක් නොමැති විට, මෙම මාර්ගෝපදේශ භාවිතා කළ හැකි වේ.

බන්ධනාගාර පුස්තකාල පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම හා ඇගයීම සඳහා ප්‍රායෝගික මෙවලමක් ලෙස යොදා ගැනීමට අමතරව, කියවීමට, ඉගෙනීමට හා තොරතුරු ලබා ගැනීමට සිරකරුවන්ට ඇති මූලික අයිතිවාසිකම් සඳහා ප්‍රතිපත්තිමය ප්‍රකාශනයක් ලෙස ද මෙම මාර්ගෝපදේශ යොදා ගත හැකි වේ. මෙම මාර්ගෝපදේශ සකස් කර ඇත්තේ පුස්තකාලයාධිපතීන්, පුස්තකාල පරිපාලකයින්, බන්ධනාගාර අධිකාරීන්, රජයේ නීති සම්පාදක හා පරිපාලන අංශ සහ බන්ධනාගාර පුස්තකාල පරිපාලනය සහ අරමුදල්

සැපයීම සඳහා වගකිව යුතු අනෙකුත් ආයතන/බලධාරීන් සඳහායි.

50 දෙනෙකු හෝ ඊට වැඩි ජනගහනයක් සහිත බන්ධනාගාර හා හිර අඩස්සියේ තබා ගන්නා අනෙකුත් ස්ථාන සඳහා මෙම මාර්ගෝපදේශ අදාළ වේ.

## පසුබිම

අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානයේ (IFLA) අවවරප්‍රසාදිත පුද්ගලයන්ට සේවා සපයන පුස්තකාල (Libraries Serving Disadvantaged Persons - LSDP) අංශය, ප්‍රජාවක් තුළ සිටින සාම්ප්‍රදායික පුස්තකාල භාවිතා කිරීමට අපොහොසත් වන කණ්ඩායම් සඳහා විශේෂිත සේවාවන් වර්ධනය කිරීමට නායකත්වය සපයයි. මෙම කණ්ඩායම්වලට රෝහල්වල හා බන්ධනාගාරවල සිටින පුද්ගලයන්, සාත්තු නිවාස හා රැකබලා ගැනීමේ ස්ථානවල සිටින වැඩිහිටියන්, නිවසට සීමාවූ පුද්ගලයන්, ශ්‍රවණාබාධිත, ශාරීරික හා සංවර්ධිත ආබාධිතයන් සහ කියවීමේ අපහසුතා ඇති පුද්ගලයන් ආදීහු අයත් වෙති.

මෙම මෙහෙවරට අනුකූලව, අවවරප්‍රසාදිත පුද්ගලයන්ට සේවා සපයන පුස්තකාල (LSDP) අංශයේ ස්ථාවර කමිටුවේ සාමාජිකයින් පසුගිය දශකය පුරා ඔවුන්ගේ වෘත්තීය ක්ෂේත්‍රයට අයත් වන විවිධ ජන සමූහයන්ට පුස්තකාල සේවා සැපයීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර තිබේ. මෙම මාර්ගෝපදේශ, අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානයේ (IFLA) වෘත්තීය වාර්තා මාලාවෙහි පළ කර ඇති අතර වත්මන් පර්යේෂණ හා භාවිතයන් මෙන්ම වර්ධනය වන පුස්තකාල හා

තොරතුරු තාක්ෂණ භාවිතය පිළිබිඹු වන ආකාරයට නිරන්තරයෙන් යාවත්කාලීන කර සංශෝධනය කරනු ලැබේ. මෙම ප්‍රකාශනය සිරකරුවන්ට පුස්තකාල සේවා සැපයීම සඳහා වූ මාර්ගෝපදේශවල, තුන් වන සංස්කරණය වේ.

ලොව පුරා බන්ධනාගාරවල සිටින පුද්ගලයින් සංඛ්‍යාව වැඩි වීමත් සමග ඔවුන්ට පුස්තකාල සහ තොරතුරු සේවා සැපයීමේ අවශ්‍යතාව හඳුනා ගත් අවවරප්‍රසාදිත පුද්ගලයන්ට සේවා සපයන පුස්තකාල (LSDP) අංශයේ ස්ථාවර කමිටුව විසින් 1985 වර්ෂයේ දී බන්ධනාගාර පුස්තකාල ක්‍රියාකාරී කණ්ඩායමක් පිහිටුවන ලදී. ඊළඟ වසර පහ තුළ, මෙම ක්‍රියාකාරී කණ්ඩායම විසින් බන්ධනාගාර පුස්තකාල සේවා පිළිබඳව දැනුවත් කිරීම සහ මාර්ගෝපදේශ ප්‍රකාශනයක් සඳහා පදනමක් විය හැකි තොරතුරු රැස් කිරීම සඳහා සම්මන්ත්‍රණ, වැඩසටහන්, වැඩමුළු, චන්ද්‍රිකා රැස්වීම් (Satalite Meetings) සහ සමීක්ෂණ ආදිය සඳහා අනුග්‍රහය දක්වන ලදී. ෆ්‍රාන්සිස් ඊ. කායිසර් විසින් සංස්කරණය කරන ලද සිරකරුවන් සඳහා වූ පුස්තකාල සේවා පිළිබඳ මාර්ගෝපදේශවල පළමුවැනි සංස්කරණය 1992 දී ප්‍රකාශයට පත් කරන ලද අතර මෙම ලේඛනයේ අවධානය යොමු කරන ලද්දේ පොදු මූලධර්ම සහ භාවිතයන් කෙරෙහි ය. මෙම ප්‍රකාශනය 1993 දී ස්පාඤ්ඤ භාෂාවට පරිවර්තනය කරන ලදී. 1995 දී ෆ්‍රාන්සිස් ඊ. කයිසර් විසින් ම සංස්කරණය කරන ලද මාර්ගෝපදේශවල දෙවන සංස්කරණයේ සේවා මට්ටම්, එකතුවේ ප්‍රමාණය, කාර්ය මණ්ඩලය, අරමුදල්, ඇගයීම සහ අලෙවිකරණ ක්‍රම පිළිබඳ විශේෂිත තොරතුරු ඇතුළත් විය. මෙහි ජර්මානු පරිවර්තනය ප්‍රකාශයට පත් කළේත් එම වසරේමයි.

2001 දී අවවරප්‍රසාදිත පුද්ගලයන්ට සේවා සපයන පුස්තකාල (LSDP) අංශයේ ස්ථාවර කමිටුව නැවත වරක් බටහිර හා යුරෝපීය රටවල පමණක් නොව, සංවර්ධනය වෙමින් පවතින රටවල් සහ කලින් සෝවියට් සංගමයේ කොටස් වූ රටවලද බන්ධනාගාර පුස්තකාල සේවා වර්ධනය වී ඇති ආකාරය පිළිබඳව සිය අවධානය යොමු කළේ ය. තොරතුරු තාක්‍ෂණය හා ස්වයංක්‍රීය පද්ධති හඳුන්වා දීම මගින් සියලු වර්ගවල පුස්තකාලවල සිදුවන වේගවත් හා ගැඹුරු වෙනස් වීම් පිළිබඳව ද මෙම ස්ථාවර කමිටුවේ සැලකිල්ල යොමු විය. මේ අනුව,

1. ආයතනගත පුද්ගලයන් (බන්ධනාගාර ඇතුළු) ඇතුළත් වන ලෙස රාජ්‍ය පුස්තකාල පද්ධතිය පුළුල් කර ඇති ආකාරය පරීක්‍ෂා කිරීම.

2. බන්ධනාගාර පුස්තකාලවල වත්මන් තත්ත්වය පිළිබඳව ජාත්‍යන්තර සාහිත්‍ය ගවේෂණයක් සිදු කිරීම, සහ

3. දැනට පවතින ජාතික ප්‍රමිති/මාර්ගෝපදේශ හා සේවා සැපයුම් පිළිබඳ තොරතුරු රැස් කිරීම

ආදී කටයුතු සඳහා කුඩා ක්‍රියාකාරී කණ්ඩායමක් ස්ථාපිත කරන ලදී. මෙහි අවසාන අරමුණ වූයේ 21 වන සියවසේ පළමු දශකයේත් ප්‍රයෝජනවත් විය හැකි ආකාරයට සිරකරුවන් සඳහා වූ පුස්තකාල සේවා පිළිබඳ මාර්ගෝපදේශවල නව සංස්කරණයක් පළ කිරීමයි. සමීක්‍ෂණයෙන් සොයා ගත් කරුණු වත්මන් සංස්කරණයට ඇතුළත් කර තිබේ.

## දර්ශනය සහ උපකල්පන

නූතන සමාජයන් මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශ්ව ප්‍රකාශනයට අනුකූලව සාපරාධී යුක්තිය සහ සිරගත කිරීම සම්බන්ධයෙන් ක්‍රම ක්‍රමයෙන් වඩාත් කාරුණික හා ප්‍රායෝගික භාවිතයන් අනුගමනය කරන බැවින් ඔවුන් තමන්ගේ අවධානය දඬුවම් දීම වෙනුවට අධ්‍යාපනය, පුනරුත්ථාපනය සහ කාලය ඵලදායී ලෙස භාවිතා කිරීම වැනි කාරණා වෙත යොමු කරන ලදී. මේ අනුව අධ්‍යාපනික, විනෝදාත්මක සහ පුනරුත්ථාපන වැඩසටහන් සඳහා පූර්ණ සහයෝගය ලබා දෙන බන්ධනාගාර පුස්තකාලය සමස්ත බන්ධනාගාර පරිසරයේ ම වැදගත් අංගයක් බවට පත් වේ. ඉතා අධික ලෙස නියාමනයට යටත් වූ පරිසරයක් තුළ බන්ධනාගාර පුස්තකාලය, පුද්ගලයන්ට නිදහසේ තීරණ ගත හැකි හා තමන් කැමති කටයුතුවල නියැළිය හැකි ස්ථානයක් ලෙස එක්තරා මට්ටමක 'සාමාන්‍ය' තත්වයක් ලබා දෙයි. පුස්තකාලය බාහිර ලෝකයට කවුළුවක් සපයන අතර, බාහිර ලෝකයට නිදහස් වීමට සූදානම් වන අයට එයින් බොහෝ ප්‍රයෝජනවත් තොරතුරු ලබා ගත හැකි වේ.

ඉගෙනීමට හා තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය සිරගත කර ඇති පුද්ගලයෙකුට අහිමි කර නැති අතර නිදහස් ලෝකයේ ප්‍රජා පුස්තකාලයක් ලබා දෙන ද්‍රව්‍ය හා සේවාවන්ට සමාන තත්වයක් බන්ධනාගාර පුස්තකාලය මගින් ද සැපයිය යුතුය. පුස්තකාල ද්‍රව්‍ය හා තොරතුරුවලට ප්‍රවේශ වීම සීමා කළ යුත්තේ ඒ මගින් බන්ධනාගාරයේ ආරක්ෂාවට තර්ජනයක් තිබේ නම් පමණි.

බන්ධනාගර පුස්තකාල, සාමාන්‍ය මහජන පුස්තකාල ආකෘතිය අනුගමනය කළ යුතු අතර බන්ධනාගාර අධ්‍යාපන හා පුනරුත්ථාපන

වැඩසටහන් සඳහා අවශ්‍ය සම්පත් සහ අනෙකුත් විශේෂ බන්ධනාගාර අවශ්‍යතා (උදා. නීති ග්‍රන්ථ එකතු) සපුරාලිය යුතුය. බහු සංස්කෘතික සහ බහු භාෂා පරිශීලකයන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

සාක්ෂරතා කුසලතා දියුණු කර ගැනීම, පෞද්ගලික හා සංස්කෘතික ක්‍රියාවල යෙදීම මෙන් ම යාවජීව ඉගෙනීම සඳහා ද බන්ධනාගාර පුස්තකාල විසින් වරදකරුවන්ට අවස්ථාව ලබා දිය යුතුය. මෙම සියලු ක්‍රියාකාරකම් සඳහා සම්පත් සැපයීමට පුස්තකාලය කටයුතු කළ යුතු වේ.

සිරකරුවන්ට පුස්තකාල සේවා ස්ථාපිත කිරීම සහ අනුග්‍රහය දැක්වීම සඳහා පදනම ලෙස ජාත්‍යන්තර වශයෙන් අනුමැතිය ලත් පහත දැක්වෙන ලේඛන යොදා ගත හැකි වේ.

1. සිරකරුවන්ට සැලකීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මත අවම රීතිවල 40 වන රීතියේ (1955) මෙසේ සඳහන් වේ. 'සියලු වර්ගවල සිරකරුවන්ගේ භාවිතය සඳහා සෑම ආයතනයක ම විනෝදාස්වාද හා උපදේශාත්මක පොත් ප්‍රමාණවත් ලෙස ගබඩා කර ඇති පුස්තකාලයක් තිබිය යුතු අතර, එය හොඳින් භාවිතා කිරීමට සිරකරුවන් දිරිමත් කළ යුතුය.'

2. අන්තර් ජාතික පොත් කමිටුව සහ ජාත්‍යන්තර ප්‍රකාශකයින්ගේ සංගමය විසින් සම්පාදනය කරන ලද හා යුනෙස්කෝ ආයතනය විසින් ප්‍රකාශයට පත් කරන ලද පාඨකයන් සඳහා වූ ප්‍රඥප්තියේ (1994) 'කියවීම සාර්ව අයිතියක්' බව සඳහන් වේ.

3. අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධාන හා යුනෙස්කෝ ආයතනය (IFLA /UNESCO) මගින් පළ කරන ලද මහජන පුස්තකාල ප්‍රතිපත්ති ප්‍රකාශනය (1995) සිරකරුවන්ට සේවය කරන ලෙස මහජන පුස්තකාලවලින් ඉල්ලා සිටී.

4. යුරෝපියානු කවුන්සිලය විසින් අනුමත කරන ලද බන්ධනාගාර තුළ අධ්‍යාපනය පිළිබඳ වාර්තාවේ (Strasbourg,1990) බන්ධනාගාර පුස්තකාල පිළිබඳ පරිච්ඡේදයක් ඇතුළත් කර තිබේ. බන්ධනාගාර පුස්තකාලයක් ක්‍රියාත්මක විය යුත්තේ ප්‍රජා පුස්තකාලයක ඇති වෘත්තීය ප්‍රමිතිවලට සමාන තත්ත්වයන් යටතේ බවත්, එය පාලනය කළ යුත්තේ වෘත්තීය පුස්තකාලයාධිපති කෙනෙකු බවත්, සංස්කෘතික වශයෙන් විවිධ වූ ජනගහනයක අවශ්‍යතා හා රුචි අරුචිකම් සපුරා ලිය යුතු බවත්, සිරකරුවන්ට එය විවෘත ප්‍රවේශයක් තිබිය යුතු බවත්, සාක්ෂරතාව හා කියවීම සම්බන්ධ ක්‍රියාකාරකම් පරාසයක් ලබා දිය යුතු බවත් මෙහි නිර්දේශ කර තිබේ.

ලොව පුරා බොහෝ රටවල බන්ධනාගාරවල සිටින බොහෝ දෙනෙකුට ඇත්තේ සීමිත අධ්‍යාපනයක් හා සීමිත ජීවන කුසලතා වන අතර, ඔවුන් නිතර කියවීමේ නිරත වූ හෝ එය ජනප්‍රිය කටයුත්තක් වූ පරිසරයකින් පැවත එන්නන් නොවේ. ඇත්ත වශයෙන් ම, සිරකරුවන් සැලකිය යුතු සංඛ්‍යාවකට ඇත්තේ අඩු සාක්ෂරතාවක් හා ප්‍රමාණවත් නොවන රැකියා නිපුණතා බව සොයා ගෙන තිබේ. බන්ධනාගාරයෙන් පිටත ගත කර ඇති ඔවුන්ගේ ජීවිත කාලය තුළ දී මහජන හෝ ශාස්ත්‍රීය

පුස්තකාලයක් නිතිපතා භාවිතා කර ඇත්තේ ඉතා සීමිත පිරිසකි.

සිරගත කරන පුද්ගලයා කියවන දේ, පුස්තකාල එකතුවෙහි ගුණාත්මකභාවය සහ අදාළත්වය මත රඳා පවතී. සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයක්, රැඳවියන්ගේ අධ්‍යාපනය, විනෝදය සහ පුනරුත්ථාපන අවශ්‍යතා සපුරා ලන ද්‍රව්‍ය එකතුවක් මෙන් ම, ආකර්ෂණීය භෞතික පරිසරයක් සහිත බන්ධනාගාර පුස්තකාලයක් බන්ධනාගාර ජීවිතයේ හා ඔවුන්ගේ වැඩ සටහන්වල වැදගත් අංගයක් විය හැකිය. පුස්තකාලය බාහිර ලෝකයට වැදගත් 'දිවියොතක්' ලෙස ද ක්‍රියා කරයි. නිකරුණේ කාලය ගත කිරීම අඩු කරමින් හා කාලය ඵලදායී ලෙස යොදා ගැනීම දිරි ගන්වමින් බන්ධනාගාර බලධාරීන්ට පුස්තකාලය සාර්ථක කළමනාකරණ මෙවලමක් ලෙස යොදා ගත හැකිය. අවසාන වශයෙන් සඳහන් කළ හැක්කේ නිදහස් කළ වරදකරුවෙකු බාහිර ලෝකයේ දී සාර්ථක වීම හෝ අසාර්ථක වීම තීරණය කරන වැදගත් තොරතුරු සම්පත වනු ඇත්තේ බන්ධනාගාර පුස්තකාලය බවයි.

# මාර්ගෝපදේශ

## 1. විෂය පථය

1.1 පුද්ගලයන් සිර භාරයේ තබා සිටින සියලු ස්ථානවලට මෙම මාර්ගෝපදේශ අදාළ වේ. මෙම ස්ථාන වන්නේ බන්ධනාගාර, සිර ගෙවල්, රක්ෂිත බන්ධනාගාර, රැඳවුම් මධ්‍යස්ථාන, අධිකරණ වෛද්‍ය රෝහල් හෝ බන්ධනාගාර අධිකාරීන් විසින් පාලනය කරනු ලබන වෙනත් ආයතනයි. මෙම මාර්ගෝපදේශ වැඩිහිටි හා බාල වයස් රැඳවුම් ස්ථාන යන දෙවර්ගයට ම වලංගු වේ.

## 2. පරිපාලනය

2.1 පුස්තකාල සේවා සැපයීම සඳහා වූ ලිඛිත ප්‍රතිපත්ති ජාතික සහ/හෝ ප්‍රාදේශීය බන්ධනාගාර අධිකාරීන් විසින් සකස් කළ යුතුය. මෙම ප්‍රතිපත්තියේ පුස්තකාල සේවාවේ මෙහෙවර හා අරමුණු මෙන් ම අරමුදල් ලබා ගන්නා මූලාශ්‍ර සහ පරිපාලන වගකීම් පැහැදිලිව දැක්විය යුතුය. මෙම ප්‍රතිපත්ති අදාළ පුස්තකාල නීති හා රෙගුලාසි මත පදනම් විය යුතු අතර එය නිරතුරුව සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතු වේ.

2.2 බන්ධනාගාර පුස්තකාල ප්‍රතිපත්ති ප්‍රාදේශීය පුස්තකාල ක්‍රියාවලි දියුණු කිරීම සඳහා පදනම විය යුතු අතර ඒ මගින් දෛනික මෙහෙයුම් හා පුස්තකාලය විවෘතව පවතින කාල වේලාවන්, පුස්තකාල ද්‍රව්‍ය තෝරා ගැනීම, සූචිකරණය/පිරිසැකසුම්කරණය, පරිත්‍යාග, සංසරණය සහ ද්‍රව්‍යවලට ප්‍රවේශය, ඉන්වෙන්ටරිය හා අපසාරණය, හිමිකම් අයිතියට අනුකූලතාව, පුස්තකාල දත්ත එකතු කිරීම, කාර්ය මණ්ඩලය, අයවැය සකස් කිරීම, පාඨක සේවා, ප්‍රතිපත්ති සමාලෝචනය සහ පරිගණක/තොරතුරු තාක්ෂණ භාවිතය ආදි ක්ෂේත්‍රයන්ට අවධානය යොමු කළ යුතුය.

2.3 බන්ධනාගාර පුස්තකාලවල පරිපාලනය සහ අරමුදල් සපයන බලධාරීන්, රටවල් අනුව වෙනස් වන බැවින් (ජාතික අධිකරණ අමාත්‍යාංශය, ප්‍රාන්ත හෝ නාගරික ආණ්ඩු, මහජන පුස්තකාලය හෝ පුස්තකාල පද්ධතිය, සංස්කෘතික හා අධ්‍යාපන අමාත්‍යාංශය වැනි) සහ ඇතැම් අවස්ථාවල දී රාජ්‍ය ආයතන කිහිපයක් මෙම අධිකාරිය/ වගකීම හවුලේ දරන බැවින්, ඒ ඒ පාර්ශවකරුවන්ගේ දායකත්වය සහ සපයනු ලබන සේවා මට්ටම් නිශ්චිතව දැක්වෙන නීතිමය ගිවිසුමක්/කොන්ත්‍රාත්තුවක් අත්සන් කිරීම වැදගත් වේ.

2.4 පුස්තකාලය සඳහා දිගු කාලීන පරාසයක (අවුරුදු 3-5) සැලසුමක් ක්‍රියාත්මක කිරීම තදින් ම නිර්දේශ කෙරේ. මෙම සැලසුම, පරිශීලක ජනගහනයේ සියලු අවශ්‍යතා ඇගයීම මත පදනම් විය යුතුය. එහි මෙහෙවර ප්‍රකාශනයක් හා ආයතනය තුළ පුස්තකාලයෙහි මූලික කාර්යභාරය (උදා. විනෝදයට කියවීම සඳහා සම්පත්, අධ්‍යාපන වැඩසටහන් සඳහා උපකාරක මධ්‍යස්ථානය, ස්වයං අධ්‍යාපන හා යාවජීව ඉගෙනීම සඳහා සම්පත්, සංස්කෘතික මධ්‍යස්ථානය, වෘත්තීය මාර්ගෝපදේශ හා රැකියා තොරතුරු මධ්‍යස්ථානය, නෛතික ද්‍රව්‍ය මධ්‍යස්ථානය ආදිය) ඇතුළත් විය යුතුය. තවද මෙම සැලසුමේ, අරමුණු, මිනිය හැකි ඉලක්ක, අරමුණු

සම්පූර්ණ කිරීම සඳහා ක්‍රමෝපායයන් සහ ඇගයුම් ක්‍රම ආදිය අඩංගු විය යුතුය. බන්ධනාගාර පරිපාලනය විසින් සැලැස්ම අනුමත කළ යුතු වේ.

2.5 ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටිවලට අනුකූලතාව සහතික කිරීමත්, සේවාවන්ගේ ඵලදායීතාව මැනීමත් සඳහා සෑම වසර 3-5 වරක් පුස්තකාල වැඩසටහනේ කාර්ය සාධනය පිළිබඳ ඇගයීමක් සිදු කිරීම ප්‍රයෝජනවත් වේ.

## 3. ප්‍රවේශය

3.1 ඔවුන්ගේ ආරක්ෂාව වර්ගීකරණය සහ ඔවුන් බන්ධනාගාරය තුළ සිටින ස්ථානය කුමක් වුවත් සියලු ම සිරකරුවන්ට පුස්තකාලය හා එහි සේවාවන් ලබා ගැනීමට හැකි විය යුතුය. පුස්තකාල සේවා සඳහා ප්‍රවේශය සීමා කළ යුත්තේ ලිඛිත පුස්තකාල නීති රීති උල්ලංඝනය කිරීමක දී පමණක් විය යුතුය.

3.2 බන්ධනාගාරය තුළ ගමන් බිමන් සීමා කර නොමැති සිරකරුවන් හට ද්‍රව්‍ය තෝරා ගැනීම සහ පරීක්ෂා කිරීම, විමර්ශන ගැටලු පිළිබඳ විමසීම, අන්තර් පුස්තකාල පිරුළු ඇණවුම් කිරීම, සංසරණය සඳහා නොවන ද්‍රව්‍ය කියවීම, හා පුස්තකාලය මගින් සංවිධාන කරන සංස්කෘතික කටයුතුවලට සහභාගී වීම ආදිය උදෙසා සෑම සතියක ම ප්‍රමාණවත් කාලයක් පුස්තකාලයට පිවිසීමට ඉඩ දිය යුතුය.

3.3 කාලය වෙන් කිරීම් පිළිබඳ ගැටුම් අවම කිරීම සඳහා පුස්තකාල වේලාවන්, අධ්‍යාපන වැඩසටහන් හා වැඩ පැවරුම් සමග සම්බන්ධීකරණය කළ යුතුය.

3.4 සිරකරුවන්ට රැකියා හෝ අධ්‍යයන කටයුතු සඳහා බන්ධනාගාරයෙන් පිටතට යෑමට අවසර ලබා දී ඇති විට, ඔවුන්ට ප්‍රාදේශීය, මහජන හෝ ශාස්ත්‍රීය පුස්තකාල භාවිතා කිරීමට පහසුකම් සැලසිය යුතුය.

3.5 වෙන් කර තබා ගන්නා සිරකරුවන්ට (රෝහල් වාට්ටු, ආරක්ෂණ භාරකාරත්වය, දඬුවම් ඒකක ආදිය) බන්ධනාගාර පුස්තකාල එකතුවේ සූචියට (මුද්‍රිත හෝ විද්‍යුත් ආකෘතියකට) ප්‍රවේශ වීමට හැකි විය යුතු අතර ප්‍රධාන එකතුවෙන් හා අන්තර් පුස්තකාල පිරුළු මගින් අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමට අවසර දිය යුතුය.

3.6 සෑම සීමිත නිවාස ඒකකයක ම අඩු ම වශයෙන් ජනප්‍රිය හා කාලීන පොත් සියයක් (100) හෝ එක් සිරකරුවෙකුට පොත් දෙක බැගින් හෝ දෙකෙන් වැඩි සංඛ්‍යාවකින් සමන්විත තැන්පතු එකතුවක් තිබිය යුතුය. මෙම එකතුව අවම වශයෙන් මසකට වරක් වෙනස් කළ යුතුය. සෑම සිරකරුවෙකුට ම සතියකට අවම වශයෙන් තැන්පතු එකතුවෙන් පොත් දෙකක් (2) පහසුවෙන් තෝරා ගැනීමට හැකි විය යුතුය.

3.7 සංස්කෘතික හා භාෂාමය වශයෙන් විවිධාකාර වූ ජනගහනයක සියලුම කියවීම් හා තොරතුරු අවශ්‍යතා ආයතනය තුළින් ම සපුරාලීමේ දුෂ්කරතාව පිළිගනිමින් බන්ධනාගාර පුස්තකාලය, කලාපීය හෝ ජාතික අන්තර් පුස්තකාල පිරුළු වැඩසටහනකට සම්බන්ධ විය යුතුය.

3.8 ශාරීරික හෝ සංජානන ආබාධ සහිත පරිශීලකයන් පුස්තකාලය පරිහරණය කිරීම සම්බන්ධයෙන් පවත්නා ප්‍රවේශ නීති සහ සංග්‍රහයන්ට බන්ධනාගාර පුස්තකාල අනුකූල විය යුතුය. මෙම අවශ්‍යතා, පුස්තකාල ගොඩනැගිල්ලට/අවකාශයට භෞතිකව ප්‍රවේශ වීම මෙන් ම විකල්ප, මුද්‍රිත නොවන ආකෘති, අනුවර්තී උපකරණ සහ විශේෂිත සේවා සහ නවාතැන් පහසුකම් ආදිය විය හැකියි. (නිශ්චිත නිර්දේශ සඳහා, බලන්න ආබාධ සහිත පුද්ගලයින් පුස්තකාලවලට ප්‍රවේශ වීම - පිරික්සුම් ලැයිස්තුව, බර්ගිටා ඉර්වෝල් සහ ගයිඩා ස්කට් නීල්සන් විසින් සම්පාදනය කරන ලද IFLA වෘත්තීය වාර්තා අංක 89, 2005 ISBN : 90-77897-04 http://www.ifla.org/VII/s9/nd1/iflapr-89e.pdf

## 4. භෞතික පහසුකම් සහ උපකරණ

4.1 නවීන බන්ධනාගාර තුළ, පුස්තකාලයට අයත් වන භෞතික පරිසරය පුස්තකාල භාවිතය, වැඩ ගලා යෑම සහ කාර්යාත්මකත්වය සඳහා විශේෂයෙන් සැලසුම් කළ යුතුය. පැරණි පුස්තකාල කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා නැවත සැකසීමක් අවශ්‍ය විය හැකියි. සැලසුම් කිරීමේ ක්‍රියාවලියේදී පුස්තකාල සැලසුම් කිරීමේ විශේෂඥයින්ගෙන් උපදෙස් ලබා ගත යුතුය. පුස්තකාල සේවාවල කාර්යක්ෂමතාව සහ සාර්ථකත්වය, බොහෝ දුරට එහි ඇති සාදරයෙන් පිළිගැනෙන සහ සුවදායී භෞතික පරිසරයට සම්බන්ධ වේ.

4.2 පුස්තකාලය, බන්ධනාගාර සංකීර්ණයේ මධ්‍යම ස්ථානයක පිහිටා තිබිය යුතුය. බන්ධනාගාර අධ්‍යාපන දෙපාර්තමේන්තුව තුළ හෝ එයට ආසන්නයේ පිහිටීම යෝග්‍ය වේ. සිරකරුවන් වැඩිම සංඛ්‍යාවකට පහසුවෙන් පැමිණිය හැකි ස්ථානයක පුස්තකාලය ස්ථාපිත කළ යුතු අතර ශාරීරික ආබාධ සහිත පුද්ගලයින්ට එයට ප්‍රවේශ වීමට හැකි විය යුතුය.

4.3 පුස්තකාලය වෙනම හා අගුළු දමා වැසිය හැකි ප්‍රදේශයක පිහිටුවිය යුතුය. සැලසුමේ පහත දැක්වෙන අංග ඇතුළත් විය යුතු වේ.

- කියවීම, පරිගණක භාවිතය සහ අනෙකුත් පුස්තකාලයේ නිශ්චිත කාර්යයන් සඳහා අවශ්‍ය ආලෝකය
- බිත්ති, බිම් සහ සිවිලිම සැකසීමේදී ශබ්ද අවශෝෂක ද්‍රව්‍ය යොදා පිරියම් කිරීම
- දේශගුණික වාතාවරණ පාලනය (උණුසුම, සිසිලනය, වාතාශ්‍රය)
- පොත් තැබීම සඳහා ප්‍රමාණවත් බර දැරිය හැකි රාක්ක
- අවශ්‍ය තාක්ෂණික සහ විද්‍යුත් උපකරණ සැපයීම සඳහා ප්‍රමාණවත් විද්‍යුත් හා දත්ත මාර්ග සම්බන්ධ කළ හැකි ස්ථාන

- සම්පූර්ණ පුස්තකාල අවකාශයේ දෘශ්‍ය පාලනය
- අගුල් දමා වැසිය හැකි ගබඩා කරන ඉඩ
- පිටතට ඇමතිය හැකි දුරකථන
- ඉලෙක්ට්‍රොනික හදිසි සන්නිවේදන පද්ධති

4.4 පහත දැක්වෙන කරුණු ද ඇතුළුව පරිශීලක ක්‍රියාකාරකම්, කාර්ය මණ්ඩල කටයුතු සහ ද්‍රව්‍ය ගබඩා කිරීම සහ ප්‍රදර්ශන පහසුකම් ආදිය සඳහා පුස්තකාල පරිශ්‍රය ප්‍රමාණවත් විය යුතුය.

- කවුන්ටරයක් සහ ගබඩා කිරීමේ අල්මාරි සහිත විමර්ශන ස්ථානය
- විමර්ශන කවුළුව
- පුස්තකාල කාර්යාලය
- තාක්ෂණික සැකසුම්, පරිගණක උපකරණ, රාක්ක, කබඩ්, පොත් ට්‍රොලි සහ මේස සඳහා වූ කාර්ය මණ්ඩල වැඩ කාමරය
- පුස්තකාල ද්‍රව්‍ය සඳහා රාක්ක (පොත්, සඟරා, පුවත්පත්, ශ්‍රව්‍ය දෘශ්‍ය ද්‍රව්‍ය)
- පොත් සහ ප්‍රවර්ධන ද්‍රව්‍ය සඳහා ප්‍රදර්ශන ප්‍රදේශය
- කියවීමේ මේස සහ පුටු
- සවන් දීමේ ශ්‍රවණ ප්‍රදේශය
- ග්‍රාහකයන්ගේ භාවිතය සඳහා පරිගණක
- ඡායා පිටපත් යන්ත්‍රය
- කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා ඉඩකඩ

4.5 බන්ධනාගාර ජනගහනයෙන් අවම වශයෙන් 5% කට හෝ පුස්තකාලය භාවිතයට අවසර ලබා දී ඇති රැඳවියන් උපරිම සංඛ්‍යාවට හෝ ඉඩ ලැබෙන තරමට පරිශීලක

ආසන/අධ්‍යයන ප්‍රදේශය විශාල විය යුතුය. මේස හා මැදි මං ඇතුළුව ආසන සඳහා එක් ආසනයට වර්ග මීටර 2.5 ක් ලැබෙන ආකාරයට ඉඩ වෙන් කළ යුතුය.

4.6 රාක්ක ගත කිරීමේ ප්‍රදේශය, ග්‍රන්ථ 1,000 ක් සඳහා වර්ග මීටර් 15 ක් විය යුතුය.

4.7 කාර්ය මණ්ඩල වැඩ ප්‍රදේශය එක් පුද්ගලයෙකු සඳහා වර්ග මීටර් 9 ක් බැගින් විය යුතුය.

4.8 පුස්තකාල කාර්යාලය අවම වශයෙන් වර්ග මීටර් 9 ක් විය යුතුය.

4.9 සම්පූර්ණ පුස්තකාල අවකාශයෙන් සියයට පහක් (5%) ඇතැම් පුස්තකාල ගෘහ භාණ්ඩ සහ උපකරණ සඳහා 'විශේෂ භාවිත' ඉඩ ලෙස වෙන් කර තැබිය යුතුය (පරිගණකගත හෝ කාඩ් පත් සූචිය, ශබ්දකෝෂ සහ සිතියම් පොත් ආධාරක, පරිශීලක පරිගණක, යතුරු ලියන, ඡායා පිටපත් යන්ත්‍රය, චිත්‍ර හෝ මාධ්‍ය ප්‍රදර්ශක).

4.10 ගෘහ භාණ්ඩ සහ උපකරණ තෝරා ගත යුත්තේ ඒවායේ කාර්යක්ෂමතාව, සුවපහසුව, ආකර්ෂණීයත්වය, නඩත්තුව සහ කල් පැවැත්ම සැලකිල්ලට ගනිමිනි. ආරක්ෂණ රෙගුලාසිවලට අනුකූල වන ආකාරයට පුස්තකාලය තුළ ගෘහ භාණ්ඩ සහ උපකරණ පෙළගැස්විය යුතුය. පුස්තකාලය වර්ධනය වන බැවින් හා අවශ්‍යතා වෙනස් වන බැවින් සරල මොඩියුල ගෘහ භාණ්ඩ භාවිතය නිර්දේශ කෙරේ.

## 5. තොරතුරු තාක්ෂණය

5.1 බන්ධනාගාර ආරක්ෂාවට බාධා නොවන ආකාරයට හැකි තාක් දුරට බන්ධනාගාර පුස්තකාලය වර්තමාන තොරතුරු තාක්ෂණය භාවිතා කළ යුතුය.

5.2 පුස්තකාලය විසින් අන්තර් ජාතික ප්‍රමිතිගත ආකෘතියක (MARC 21) ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත සමුදායක් භාවිතා කරන ස්වයංකෘත සංසරණ සහ සූචි පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතු වේ.

5.3 තොරතුරු, අධ්‍යාපනික හා විනෝදාත්මක කටයුතු සඳහා බහු-මාධ්‍ය මෘදුකාංග සහිත පරිගණක පරිශීලකයන්ට ලබා දීම ඉතා ඉහළින් නිර්දේශ කෙරේ.

5.4 තොරතුරු ඉල්ලීම්වලට පිළිතුරු සැපයීම, වෙබ් අඩවි පදනම් කරගත් පුස්තකාල සුචි පිරික්සීම, වෘත්තීය සගයන් සහ වෙළෙඳුන් සමඟ සන්නිවේදනය, දුරස්ථ ඉගෙනුම් පන්තිවලට සහභාගී වීම, අන්තර් පුස්තකාල පිරුළු ක්‍රම ප්‍රයෝජනයට ගැනීම ආදි කටයුතු සඳහා පුස්තකාල කාර්ය මණ්ඩලයට අන්තර්ජාලය වෙත ප්‍රවේශ වීමටත්, ඉ-තැපැල භාවිතා කිරීමටත් පහසුකම් තිබිය යුතුය.

5.5 බන්ධනාගාර ජාල ආරක්ෂණය අවසර ලබා දෙන විට, අධ්‍යාපනය සහ පිළියම් කටයුතු මෙන් ම නිදහස් වීමට පෙර කටයුතු සැලසුම් කර ගැනීම සඳහා සිරකරුවන්ට අධීක්ෂණයක් යටතේ අන්තර්ජාල පහසුකම් ලබා දිය යුතු වේ.

## 6. කාර්ය මණ්ඩලය

6.1 විශාලත්වය කුමක් වුවත් සියලු ම බන්ධනාගාර පුස්තකාල අධීක්ෂණය/කළමනාකරණය කළ යුත්තේ පුස්තකාල හා තොරතුරු විද්‍යාවෙන් විශ්වවිද්‍යාල උපාධියක් හෝ ඊට සමාන පුස්තකාල විද්‍යායතන ඩිප්ලෝමාවක් හෝ තුළින් අවශ්‍ය සුදුසුකම් හා කුසලතා ලබා ගත් වෘත්තීය පුස්තකාලයාධිපති කෙනෙකු විසිනි.

6.2 500 දෙනෙකුට වැඩි ජනගහනයක් සහිත සියලු බන්ධනාගාරවල පූර්ණකාලීන පුස්තකාලයාධිපතිවරයෙකු සිටිය යුතුය. 1000ට වැඩි ජනගහනයකින් යුත් බන්ධනාගාරවල පූර්ණකාලීන පුස්තකාලාධිපතීන් දෙදෙනෙකු සේවය කළ යුතුය. කුඩා බන්ධනාගාරවල වෘත්තීය පුස්තකාලයාධිපතිවරයෙකුගේ සේවය ලබා ගන්නා පැය ගණන පහත දැක්වෙන ආකාරයට අඩු කළ හැකිය.

| ආයතනයේ ජනගහනය | වෘත්තීය පුස්තකාලයාධිපති පැය ගණන |
|---|---|
| 0-300 | 24 |
| 301-499 | 30 |

6.3 ආයතනයේ අවශ්‍යතා අනුව අතිරේක කාර්ය මණ්ඩල සේවය ලබා ගත හැකි වේ. සම්පූර්ණ කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව බන්ධනාගාර ජනගහනයේ විශාලත්වය හා පහත දැක්වෙන සාධක අනුව වෙනස් විය හැක.

- පුස්තකාලය විවෘතව ඇති පැය ගණන
- පුස්තකාලයේ ප්‍රමාණය, ඍජු ප්‍රවේශ්‍යතාව සහ පිහිටීම
- ඕනෑම එක් වේලාවක පුස්තකාලය භාවිතය සඳහා අවසර දී ඇති පරිශීලකයින් සංඛ්‍යාව
- පුස්තකාලයේ වැඩසටහන් ප්‍රමාණය
- චන්ද්‍රිකා පුස්තකාල හෝ බෙදාහැරීමේ ස්ථාන සංඛ්‍යාව
- සීමිත ප්‍රවේශ ඒකක සංඛ්‍යාව සහ විශාලත්වය
- ස්වයංකරණ මට්ටම
- බන්ධනාගාර සංකීර්ණය තුළ ගමන් බිමන් සීමා කිරීම්
- අධ්‍යාපන හා පුනරුත්ථාපන වැඩසටහන් සංඛ්‍යාව හා වර්ග

6.4 ඍජු පරිශීලක සේවා සහ මෙහෙයුම් සහාය සැපයීම සඳහා පුස්තකාල කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට ම අවශ්‍ය වෘත්තීය හා තාක්ෂණික සුදුසුකම් තිබිය යුතුය.

6.5 බන්ධනාගාරගතව සිටින පුද්ගලයන්ගේ විවිධ හා සංකීර්ණ තොරතුරු අවශ්‍යතා පිළිබඳව පුස්තකාල සේවකයින් දැනුවත් විය යුතු අතර බන්ධනාගාර පරිසරයක ඵලදායී ලෙස හා කාර්යක්ෂමව කටයුතු කිරීම සඳහා අවශ්‍ය මානුෂික හා අන්තර්ගත පුද්ගල හැකියාවන් ඔවුන්ට තිබිය යුතුය.

6.6 බන්ධනාගාර අධිකාරිය විසින් මහජන පුස්තකාල පද්ධතියෙන් හෝ ශාස්ත්‍රීය පුස්තකාල ක්ෂේත්‍රයෙන් හෝ සංස්කෘතික ආයතන මගින් හෝ පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා සේවයට බඳවා ගත හැකිය.

6.7 බන්ධනාගාර පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා වූ වැටුප් හා රැකියා ප්‍රතිලාභ, සමාන සුදුසුකම් හා වගකීම් සහිත මහජන පුස්තකාල සේවකයින්ට හෝ සේවා යෝජකයා විසින් ඒ හා සමාන තනතුරුවලට ගෙවනු ලබන වැටුප්වලට හෝ සමාන විය යුතුය.

6.8 වෘත්තීය සංගම්වල කටයුතුවලට සහභාගී වීමට හා වෘත්තීය සංවර්ධනය සහ අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන්වලට සහභාගී වීමට පුස්තකාල කාර්ය මණ්ඩලයට අවස්ථාව ලබා දිය යුතුය.

6.9 පුස්තකාල කාර්ය මණ්ඩලය විසින් කිසිම වෙනස්කමකින් තොරව සියලු රැඳවියන්ට සේවා සැපයිය යුතු අතර පුස්තකාල භාවිත කරන්නන්ගේ පෞද්ගලිකත්වයට ගරු කළ යුතුය.

6.10 බන්ධනාගර රැඳවියන් පුස්තකාලයේ සේවය සඳහා යොදා ගත හැකිය. මෙම පුද්ගලයින් තෝරා ගත යුත්තේ පුස්තකාල ක්‍රියාකාරීත්වය හා ක්‍රියාවලි පිළිබඳ ඔවුන්ගේ කුසලතා, අත්දැකීම් සහ හුරුපුරුදුකම් අනුවයි.

6.11 ප්‍රජා ස්වේච්ඡා සේවකයින්ට ද පුස්තකාලයෙහි සේවය කළ හැකිය. මොවුන් සේවයට යොදා ගත යුත්තේ නිත්‍ය කාර්ය මණ්ඩලය වෙනුවට නොව අවශ්‍ය අවස්ථාවන්හි අමතර උපකාර හා විශේෂ වැඩසටහන් සඳහායි.

6.12 සේවකයන් ලෙස යොදා ගන්නා රැඳවියන් සහ ප්‍රජා ස්වේච්ඡා සේවකයින් යන දෙවර්ගයට ම පුළුල් අනුයෝජන වැඩසටහනක් හා රැකියාව තුළ පුහුණුවක් ලබා දිය යුතුය.

## 7. අයවැය

7.1 බන්ධනාගාර පුස්තකාල සඳහා වගකිව යුතු ආයතනය/අධිකාරිය විසින් රේඛීය අයිතමයක් ලෙස පුස්තකාලයට අරමුදල් ලබා ගත යුතු අතර, වැටුප්, පුස්තකාල ද්‍රව්‍ය, දායක මුදල්, උපකරණ, තොරතුරු තාක්ෂණය, සැපයුම්, ගිවිසුම්ගත සේවා, අන්තර් පුස්තකාල සේවා, ජාල/සංගම් සාමාජිකත්වය, කාර්ය මණ්ඩල පුහුණුව සහ දත්ත සමුදාය ගාස්තු ආදිය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදන ලැබෙන බවට සහතික විය යුතුය.

7.2 වාර්ෂික අයවැය සඳහා පදනම් කර ගත යුත්තේ දිගු කාලීන පුස්තකාල සැලැස්මයි. (2.4 බලන්න)

7.3 පුස්තකාල අයවැය ප්‍රධාන පුස්තකාලයාධිපති විසින් සකස් කර පාලනය කළ යුතු වේ.

7.4 වියදම්, පුස්තකාල ක්‍රියාකාරීත්ව සංඛ්‍යාලේඛන සහ වැඩසටහන් ප්‍රතිඵල ඇතුළත් වන වාර්ෂික ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාවක් පුස්තකාල කාර්ය මණ්ඩලය විසින් සකස් කළ යුතුය.

7.5 පහත සඳහන් සූත්‍ර දෙකෙන් එකක් අනුගමනය කරමින් වාර්ෂික පුස්තකාල ද්‍රව්‍ය අයවැය වෙන් කළ යුතු වේ.

A. 500 දෙනෙකුට වඩා වැඩි ජනගහනයක් සහිත බන්ධනාගාර සඳහා ස්ථාපිත පුස්තකාලයට අවම අයවැය ගණනය කිරීම සඳහා පදනම වන්නේ ඝන කවර පොතක සාමාන්‍ය (දේශීය මුදලින්) මිලයි.

සාමාන්‍ය ප්‍රබන්ධ - නොවන ඝන කවර පොතක මිල x රැඳවියන්ගේ ජනගහනයෙන් 70% + හානි වීම් සඳහා 10% ක්

(උදා. රැඳවියන් 500x70% x ඩොලර් 32.00 = ඩොලර් 11,200 + 1,120 (11,200න් 10%) = ඩොලර් 12,320)

පුස්තකාලය මිලට ගනු ලබන්නේ සන කවර පොත් පමණක් යයි මෙම සූත්‍රයෙන් අදහස් නොකෙරේ. එය සියලු වර්ගවල පුස්තකාල ද්‍රව්‍ය සඳහා සම්පූර්ණ අයවැය ගණනය කිරීම සඳහා වූ සරල මෙවලමකි. පොත්වල මිල වැඩි වන විට ද්‍රව්‍ය අයවැය ද වැඩි වනු ඇත.

හෝ

B. 500ට අඩු ජනගහනයක් සහිත බන්ධනාගාර සඳහා එකතුවෙන් 10% ප්‍රතිස්ථාපනය කිරීමට වාර්ෂික අවම අයවැය ප්‍රමාණවත් වේ.

7.6 නව පුස්තකාල සඳහා වූ ආරම්භක පුස්තකාල අයවැය, සම්පූර්ණ සේවා එකතුවෙන් අවම වශයෙන් 50% ක් ස්ථාපිත කිරීමට ප්‍රමාණවත් විය යුතුය. ඉන්පසු අවුරුදු පහක් තුළ ද්‍රව්‍ය එකතුව සම්පූර්ණ ප්‍රමාණයට ගෙන ඒමට ඊළඟ අවුරුදු හතර තුළ සාමාන්‍ය අයවැයට වැඩියෙන් අතිරේක අරමුදල් ලබා දිය යුතුය.

## 8. පුස්තකාල ද්‍රව්‍ය

8.1 බන්ධනාගාර ජනගහනයේ තොරතුරු, සංස්කෘතික, විනෝදාත්මක හා පුනරුත්ථාපන අවශ්‍යතා සපුරාලීම සඳහා පුස්තකාල එකතුවේ මුද්‍රිත හා අනෙකුත් ආකෘතිවල ද්‍රව්‍ය ඇතුළත් විය යුතුය. මහජන හෝ පාසල් පුස්තකාලයක් තුළ දැකිය හැකි ඒවාට සමාන කාලීන මුද්‍රිත හා මුද්‍රිත නොවන පුළුල් පරාසයක ද්‍රව්‍ය බන්ධනාගාර පුස්තකාලවල අඩංගු විය යුතුය.

8.2 වෘත්තීය පුස්තකාලයාධිපතීන් විසින් තෝරා ගනු ලබන නව ප්‍රතිග්‍රහණවලින් පුස්තකාල එකතුව නිරන්තරයෙන් වැඩි දියුණු කළ යුතුය. පරිත්‍යාග වශයෙන් ලැබෙන ග්‍රන්ථ පුස්තකාලයේ අවශ්‍යතා සපුරා ලන්නේ නම්, පරිත්‍යාගයන් මගින් සැලසුම් කළ ප්‍රතිග්‍රහණ වර්ධනය කර ගත හැකි වේ.

8.3 අන්තර්-පුස්තකාල පිරුළු, පුස්තකාල එකතුව අනුපූරණය සඳහා භාවිතා කළ හැකි නමුත් එය සැලසුම් කළ ප්‍රතිග්‍රහණ වැඩපිළිවෙළට විකල්පයක් නොවිය යුතුය.

8.4 පුස්තකාල එකතුව වෘත්තීය ප්‍රමිති අනුව කළමනාකරණය කර පවත්වා ගෙන යා යුතු අතර එය ඵලදායී ලෙස ප්‍රදර්ශනය කිරීම හා ක්‍රියාකාරී ලෙස ප්‍රවර්ධනය කිරීමට කටයුතු කළ යුතුය.

8.5 බන්ධනාගාර ජනගහනයේ ජනසංඛ්‍යාතික සංයුතිය මත පදනම්ව සකස් කළ, එකතුව කළමනාකරණය කිරීමේ ප්‍රතිපත්ති/සැලසුම් අනුව පුස්තකාල ද්‍රව්‍ය තෝරා ගත යුතුය. යමක් බන්ධනාගාරයේ ආරක්ෂාවට තර්ජනයක් එල්ල විය හැකි ග්‍රන්ථයක් අයිතමයක් ලෙස හැඳින්විය හැකි අවස්ථාවන්හිදී හැර, ද්‍රව්‍ය තෝරා ගැනීමේදී කිසිදු වාරණයක් අදාළ කර නොගන්නා බව එකතු කළමනාකරණ ප්‍රතිපත්තියෙහි/සැලැස්මෙහි පැහැදිලිවම සඳහන් කළ යුතුය. මෙම ප්‍රතිපත්ති/සැලැස්ම සකස් කිරීමේ දී පහත සඳහන් කරුණුවලට අවධානය යොමු කළ යුතු වේ.

- බන්ධනාගාර ජනගහනයේ ජනවාර්ගික/ සංස්කෘතික සංයුතිය, වයස, කියවීම් මට්ටම්, අධ්‍යාපන පසුබිම හා භාෂා
- ප්‍රජා සම්පත් හා ආධාරක කණ්ඩායම් පිළිබඳ තොරතුරු, රැකියා සහ නිවාස අවස්ථා, අධ්‍යාපනය සහ රැකියා පුහුණුව පිළිබඳ විකල්ප ඇතුළුව ප්‍රජාව තුළට නැවත පිවිසීම සඳහා සිරකරුවන් සූදානම් කිරීමට උපකාරී වන ද්‍රව්‍යවල අවශ්‍යතාව
- ආයතනය විසින් සපයනු ලබන වැඩසටහන්වලට උපකාරී වන විමර්ශන හා අනිකුත් ද්‍රව්‍යවල අවශ්‍යතාව (මත්ද්‍රව්‍ය හා මද්‍යසාර ප්‍රතිකාර, කෝපය පාලනය, මාපිය කටයුතු, සාක්ෂරතා ඉගෙනුම්, කලාව සහ සංගීතය ආදිය)

- ග්‍රන්ථ නාමයන් නිර්දේශ කිරීමේ ක්‍රියාවලියක් සහ එකතුවෙන් ග්‍රන්ථ ඉවත් කිරීම සඳහා කරන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියාවලියක්
- යල් පැන ගිය සහ අනවශ්‍ය ද්‍රව්‍ය පුස්තකාල එකතුවෙන් අපසාරණය කිරීමේ ක්‍රියාවලිය
- පරිත්‍යාග සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියාවලිය

8.6 තෝරා ගැනීමේ නිර්ණායකවලට පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු නමුත් ඒවාට සීමා විය යුතු නොවේ.

- අපේක්ෂිත ප්‍රේක්ෂකයින් සඳහා වූ විෂය සහ ශෛලිය පිළිබඳ යෝග්‍යතාව
- සිරකරුවන්ගේ අවශ්‍යතාවන් සහ රුචි අරුචිකම්වලට අවධානය යොමු කිරීම
- විවේචකයින්, විචාරකයින් සහ මහජනතාවගේ අවධානය
- කලාත්මක, සමාජයීය, විද්‍යාත්මක හෝ සංස්කෘතික වැදගත්කම
- කරුණු පිළිබඳ නිරවද්‍යතාව
- පුස්තකාලයේ භාවිතය සඳහා ආකෘතියේ යෝග්‍යතාව
- පවත්නා පුස්තකාල එකතුව සහ විෂය ආවරණයට අදාළත්වය
- පිරිවැය

8.7 පුළුල් පරාසයක අදහස් හා මත නියෝජනය කරන 'සමබර' එකතුවක් වර්ධනය කිරීමට පුස්තකාලය වෙර දැරිය යුතුය. ඇතැම් ජනගහන කණ්ඩායම් අතර ජනප්‍රිය නො විය හැකි යම් යම් ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා 8.6 යටතේ දක්වා ඇති නිර්ණායක භාවිතා නො කළ යුතුයි.

8.8 පරිත්‍යාග වශයෙන් ලැබෙන ද්‍රව්‍ය සඳහා ද කිසිදු වෙනසක් නොමැතිව මිල දී ගන්නා ද්‍රව්‍යවලට අදාළ කර ගන්නා වූ එකම තෝරා ගැනීමේ නිර්ණායක යොදාගත යුතුය.

8.9 පුස්තකාල එකතුවට පහත දැක්වෙන ආකාරයේ ද්‍රව්‍ය ඇතුළත් විය යුතුය. (දේශීය භාෂාවෙන් සහ අවශ්‍යතාවන්ට අනුකූලව වෙනත් භාෂාවලින්)

- සාමාන්‍ය විමර්ශන ග්‍රන්ථ
- පුළුල් පරාසයක ප්‍රභේද ඇතුළත් ප්‍රබන්ධ (ආදර කතා, අභිරහස්, අපරාධ, විද්‍යා ප්‍රබන්ධ, මනඃකල්පිත, භීම කතා ආදිය)
- චරිතාපදාන
- ස්වසාධනය, ජීවන කුසලතා සහ පෞද්ගලික සබඳතා කෙරෙහි වැඩි අවධාරණයක් සහිතව සම්මත ඩිවි විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන ප්‍රබන්ධ නොවන ප්‍රකාශන
- නීතිමය ද්‍රව්‍ය (තොරතුරු අවශ්‍යතා සපුරාලීමට මෙන් ම ව්‍යවස්ථාමය හෝ උසාවි නියම කළ අවශ්‍යතා සපුරාලීම සඳහා)
- කවි (බන්ධනාගාර තුළ ඉතා ජනප්‍රියයි)
- චිත්‍ර කථා සහ ග්‍රැෆික් නවකතා (කියවීම ආරම්භ කරන අයට සහ ඒවාට දැඩි ළැදියාවක් දක්වන යන දෙවර්ගයම සඳහා)
- ස්වයං අධ්‍යයන ද්‍රව්‍ය (දුරස්ථ ඉගෙනුම්, තැපැල් මාර්ගික ඉගෙනුම් සහ යාවජීව අධ්‍යාපනය සඳහා සහාය වීම)
- පහසුවෙන් කියවිය හැකි ද්‍රව්‍ය (කියවීමේ ගැටලු සහිත පාඨකයන් සහ දේශීය නොවන භාෂා කථා කරන අය සඳහා)

- විශාල අකුරු සහිත පොත් (දෘශ්‍යාබාධ සහිත පුද්ගලයන් සඳහා)
- ශ්‍රව්‍ය පොත් (සියලු පරිශීලකයින් සහ දෘශ්‍ය හා කියවීමේ ගැටලු සහිත අය සඳහා)
- ශ්‍රව්‍ය-දෘශ්‍ය ද්‍රව්‍ය, බහුමාධ්‍ය සහ පරිගණක මෘදුකාංග (අවශ්‍ය උපකරණ ඇත්නම්)
- ප්‍රජා තොරතුරු (නිදහස් කිරීමට පෙර සැලසුම් කටයුතු, රැකියා සොයා ගැනීම ආදිය සඳහා ප්‍රයෝජනවත් වන කුඩා පොත්, නාමාවලි හා අත්පොත් ආදිය)
- සාක්ෂරතා සහ ගණිතමය ද්‍රව්‍ය (කියවීම, ලිවීම සහ ගණිත කුසලතා වැඩි දියුණු කිරීම සඳහා)
- ප්‍රහේලිකා, ක්‍රීඩා (අධ්‍යාපනය සහ විනෝදය සඳහා)
- සඟරා (පොදු රුචිකත්වය සහ විෂය විශේෂිත-සියලු පරිශීලකයන් සඳහා)
- පුවත්පත් (සියලු ම සිරකරුවන්ට ලෝකය පිළිබඳව හා දේශීය කටයුතු පිළිබඳ ව දැනුවත් වීමට සහ තම නිවාසී ප්‍රජාව සමග සම්බන්ධතා පවත්වා ගැනීමට)

8.10 සාම්ප්‍රදායික මුද්‍රිත ප්‍රකාශන භාවිතා කළ නොහැකි (ශාරීරික හෝ සංවේදී ආබාධ සහිත පුද්ගලයින් සහ කියවීමේ සහ ඉගෙනීමේ ආබාධ ඇති අය ඇතුළුව) සිරකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීමට විකල්ප ආකෘතිවලින් ප්‍රමාණවත් තරම් ද්‍රව්‍ය තිබිය යුතුය. අන්තර් පුස්තකාල පිරුළු සේවා මගින් මෙම ද්‍රව්‍ය පරිපූරණය කළ හැකිය.

8.11 අවම වශයෙන් 'ප්‍රමාණවත්' එකතුවක් ලෙස සැලකිය හැකි ද්‍රව්‍ය සංඛ්‍යාව සාධක ගණනාවක් අනුව වෙනස් වනු ඇත. මෙම සාධක වන්නේ බන්ධනාගාර ජනගහනයේ ප්‍රමාණය, හිර අඩස්සි මට්ටම්, චන්ද්‍රිකා පුස්තකාල සංඛ්‍යාව, රැඳී සිටින සාමාන්‍ය කාලය, සහභාගී විය හැකි වැඩ හා අධ්‍යාපන වැඩසටහන්, සතියකට පුස්තකාලයට යන වාර ගණන හා

පුස්තකාලයෙන් ලබා දෙන වැඩසටහන්/ක්‍රියාකාරකම්වල ප්‍රමාණය ආදියයි. මෙම සාධක සැලකිල්ලට ගනිමින්, පූර්ණ සේවා පුස්තකාලයක් සඳහා පොදු මාර්ගෝපදේශය වන්නේ පහත දැක්වෙන ද්‍රව්‍යවල අවම ප්‍රමාණයක් තිබීමයි. (විශාල ඉල්ලුමක් ඇති අයිතමවල බහු පිටපත් තිබිය යුතු වේ.)

**ග්‍රන්ථ:** අයිතම 2000ක ග්‍රන්ථ එකතුවක් හෝ එක් රැඳවියෙකු සඳහා ග්‍රන්ථ 10ක් බැගින් යන දෙකෙන් වැඩිම සංඛ්‍යාව

**සඟරා:** අවම වශයෙන් සඟරා 20ක එකතුවක් හෝ සිරකරුවන් විස්සකට (20) එක් සඟරාව බැගින් හෝ යන දෙකෙන් වැඩිම සංඛ්‍යාව

**පුවත්පත්:** ප්‍රාදේශීය, ජාතික හා විදේශීය පුවත්පත්-සංඛ්‍යාව තීරණය කළ යුත්තේ බන්ධනාගාර ජනගහනයෙන් නියෝජනය වන භූගෝලීය ප්‍රදේශ/රටවල් අනුවයි.

**ශ්‍රව්‍ය සහ දෘශ්‍ය අයිතම, බහුමාධ්‍ය හා පරිගණක මෘදුකාංග:** මූලික අවශ්‍යතා සපුරාලීමට සහ දැනට ක්‍රියාත්මක වන බන්ධනාගාර වැඩසටහන් සඳහා අවශ්‍ය සහාය ලබා දීමට ප්‍රමාණවත් සංඛ්‍යාවක්. අන්තර් පුස්තකාල පිරුළු (ILL), කලාපීය සුසංවිධාන (කොන්සෝටියම) හෝ ජාතික එකතුවලින් අවශ්‍ය පරිදි අමතර ද්‍රව්‍ය ලබා ගත හැක.

8.12 සියලු පුස්තකාල ද්‍රව්‍ය, ජාතික හා/හෝ ජාත්‍යන්තර ප්‍රමිති අනුව වර්ගීකරණය හා සූචිකරණය කළ යුතුය. ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත සමුදායකට පිවිසීමේ හැකියාව තිබේ නම්, ආයතනය තුළ සූචිකරණය කිරීමේ අවශ්‍යතාව මඟ හරිමින් එවැනි මූලාශ්‍රවලින් සූචිකරණ දත්ත ලබා ගත යුතුය.

8.13 පුස්තකාල ද්‍රව්‍ය හොඳින් නඩත්තු කර, විවෘත හා පහසු ප්‍රවේශය සඳහා ඒවායේ යොමු/ඇමතුම් අංක ලේබල අලවා තිබිය යුතුය.

8.14 සෙවුම් හැකියාවන් දියුණු කිරීම, එකතුව කළමනාකරණය, එහි භාවිතය පිළිබඳ තොරතුරු ලබා ගැනීම ආදිය සඳහා ස්වයංකෘත සූචියක් සහ සංසරණ පද්ධතියක් ස්ථාපිත කිරීම තදින් ම නිර්දේශ කරනු ලැබේ.

## 9. සේවාවන් සහ වැඩසටහන්

9.1 රැඳවියන් සඳහා වූ පුස්තකාල සේවාවේ ප්‍රමාණය හා මට්ටමට පදනම් විය යුත්තේ බන්ධනාගාර ජනගහනයෙන් ජනසංඛ්‍යාතික පැතිකඩ හා පුස්තකාලයේ දීර්ඝ කාලීන සැලැස්මයි. (2.4 බලන්න) පරිශීලක සේවාවන්ට පහත දැක්වෙන කරුණු ඇතුළත් විය යුතු නමුත් ඒවාට ම සීමා නොවිය යුතුය.

- ආයතනයේ ඇති ද්‍රව්‍යවලින් සහ හැකි අවස්ථාවන්හි අන්තර්ජාල සම්පත් භාවිතයට ගනිමින් විමර්ශන හා තොරතුරු සේවා සැපයීම - පරිශීලකයන්ගේ නොයෙකුත් සාධකමය කරුණු සහ දත්ත අවශ්‍යතා සපුරාලීමට

- පාඨක උපදේශන සේවාව - උනන්දුවක් දක්වන්නා වූත්, යෝග්‍ය කියවීම් මට්ටම්වලට අදාළ වූත් දේ පරිශීලකයින්ට නිර්දේශ කිරීම.

- පුස්තකාල භාවිතය පිළිබඳ ව නිරතුරුව හුරුපුරුදු කිරීම, අනුස්ථාපනය හා උපදෙස් ලබා දීම

- අන්තර් - පුස්තකාල පිරුළු - කලාපීය හා රාජ්‍ය පද්ධති, ජාල හෝ වෙනත් සහයෝගීතා සබඳතා තුළින් අනෙකුත් පුස්තකාල සංචිතයන්ට ප්‍රවේශ වීම

- ආබාධ සහිත පුද්ගලයින් සඳහා විශේෂ ද්‍රව්‍ය සැපයීම (උදා. අන්ධයන් සඳහා ජාතික පුස්තකාලයෙන් ද්‍රව්‍ය, ආබාධිත උපකාර කණ්ඩායම් ආදිය)

9.2 පුස්තකාලය විසින් සාමාන්‍ය ජනගහනයේ අයට ලබා දෙන සේවාවන්ට සමානවම සීමිත තත්ත්වයේ සිටින රැඳවියන්ට ද සේවා සැපයිය යුතුය. (3.4 සහ 3.5 බලන්න.)

9.3 කියවීම, සාක්ෂරතාව සහ සංස්කෘතික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කරන වැඩසටහන් පුස්තකාල විසින් සංවිධාන කළ යුතුය. එවැනි වැඩසටහන් නිසා කාලය නිර්මාණාත්මක ලෙස ගත කිරීමටත්, ජීවිතයේ ගුණාත්මක බව වැඩි දියුණු කර ගැනීමටත් සිරකරුවන්ට අවස්ථාව සැලසේ. සමාජ කුසලතාවන් සහ ආත්මාභිමානය වැඩිදියුණු කර ගැනීමට ද එය උපකාරී වේ. ඵලදායී කටයුතුවල යෙදෙන රැඳවියන්ගේ ගැටලු සහ කලබල ඇති කිරීමේ ප්‍රවණතාව අඩු බව පිළිබඳව බන්ධනාගාර අධිකාරීන් දැනුවත් විය යුතුය. සිත් ගන්නා සුළු හා අදාළ පුස්තකාල වැඩසටහන් සඳහා ප්‍රයෝජනවත් උදාහරණ කීපයක් පහත දැක්වේ.

- කතුවරුන්ගේ කියවීම
- පොත් සමාජ සහ සාකච්ඡා
- පුස්තකාල සම්පත් භාවිතා කරන සාහිත්‍යමය හා 'දැනුම්' තරග
- නිර්මාණාත්මක ලේඛන වැඩමුළු
- සංගීත වැඩසටහන්
- චිත්‍ර වැඩමුළු සහ ප්‍රදර්ශන
- සාක්ෂරතා ඉගැන්වීම්
- අක්ෂර වින්‍යාස තරග
- උත්සව දින සහ සංස්කෘතික උත්සව
- රැකියා පොළ

සියලු ම බන්ධනාගාර සඳහා මෙම ක්‍රියාකාරකම් සියල්ල ම සුදුසු නො වීමට ඉඩ තිබේ. පුස්තකාලයේ අනුග්‍රහයෙන් පවත්වන වැඩසටහන්, බන්ධනාගාරයේ සමස්ත මෙහෙවර සමග අනුකූල විය යුතු අතර ඒවා පරිපාලනය විසින් අනුමත කළ යුතුය.

## 10. සන්නිවේදනය සහ අලෙවිකරණය

10.1 බන්ධනාගාර පුස්තකාල කාර්ය මණ්ඩලය විසින් පුස්තකාල පරිශීලකයන් සමඟ විවෘත දෙ-මං සහභාගීත්ව සන්නිවේදනයක් පවත්වා ගත යුතු අතර යෝජනා ඉදිරිපත් කිරීමට පරිශීලකයන්ට ඉඩ දිය යුතුය, පරිශීලක තෘප්තිය පිළිබඳ සමීක්ෂණ නිරතුරුව පැවැත්වීම නිර්දේශ කරනු ලැබේ. පරිශීලකයන්ගේ යෝජනා කාලානුරූපව ක්‍රියාත්මක කළහොත් පුස්තකාලයේ විශ්වසනීයත්වය බෙහෙවින් වැඩි වනු ඇත.

10.2 විදේශ භාෂා කථා කරන සිරකරුවන්ට අධ්‍යාපන සහ බන්ධනාගාර වැඩසටහන්වලට සහභාගී වීම අසීරු වන බැවින්, ඔවුන් සමඟ සන්නිවේදනය කිරීමට අමතර වෑයමක් දැරිය යුතුය.

10.3 සහාය හා සම්පත් ලබා දෙමින් පුස්තකාල කාර්ය මණ්ඩලය අනිකුත් බන්ධනාගාර දෙපාර්තමේන්තුවලට උපකාර කළ යුතුය. හරස් ශික්ෂණ වැඩසටහන්, උපදේශක කමිටු හා විශේෂ ව්‍යාපෘතිවලට සහභාගීවීමෙන් පරිපාලනය තුළ පුස්තකාලයේ වැදගත්කම වැඩි දියුණු කිරීමට පුස්තකාල කාර්ය මණ්ඩලයට කටයුතු කළ හැකි වේ. පන්ති හා රැඳවුම් කණ්ඩායම් පුස්තකාලයට ගෙන ඒමට අධ්‍යාපන සහ පිරියම් කාර්ය මණ්ඩලය (Treatment Staff) දිරිමත් කළ යුතුය.

10.4 පුළුල් පරාසයක බන්ධනාගාර දෙපාර්තමේන්තු සහ සිරකරු කණ්ඩායම්වලින් නියෝජනයක් සහිත බන්ධනාගාර පුස්තකාල උපදේශක කමිටුවක් පත් කිරීම නිර්දේශ කරනු ලැබේ. කමිටු සාමාජිකයින්ට පුස්තකාලය වෙනුවෙන් පෙනී සිටීමට හැකි අතර පුස්තකාල කාර්ය මණ්ඩලයට ප්‍රතිචාර ලබාගැනීමේ දී ද ඔවුන් ඉතා ප්‍රයෝජනවත් විය හැකියි.

10.5 බන්ධනාගාරයේ පුස්තකාල සේවකයන්ට තම රැකියාව තුළ ඔවුන් හුදකලා වී ඇතැයි හැඟෙන අතර 'පිටත' සිටින ඔවුන්ගේ වෘත්තීය සගයන් සමඟ නිරන්තර ව සබඳතා පවත්වා ගැනීමට නොලැබේ. වෘත්තීය ජාලයක කොටසක්

වීමෙන්, අන්තර්ජාල සාකච්ඡා කණ්ඩායම්වලට සහභාගී වීමෙන්, පුවත් පත්‍රිකාවලට දායක වීමෙන්, වෘත්තීය සම්මන්ත්‍රණ හා වැඩමුළුවලට සහභාගී වීමෙන්, වෘත්තීය සාහිත්‍යයට ලිපි ලේඛන සැපයීමෙන් හා පුස්තකාල පාසල්වල ශිෂ්‍යයන්ට දේශන පැවැත්වීම ආදියෙන් මෙම හුදෙකලාව නැති කර ගත හැකි වේ.

10.6 පුස්තකාල කාර්ය මණ්ඩලයට පුස්තකාලය හා එහි ඇති ද්‍රව්‍ය විවිධ ආකාරයෙන් ප්‍රවර්ධනය කළ හැකියි. පුස්තකාලයට පුද්ගලයින් ගෙන ඒමේ ඵලදායී ක්‍රම අතර, පුස්තකාලය පිළිබඳ වර්ණවත් පොත් පිංචක් ප්‍රකාශයට පත් කිරීම සහ පුළුල් ව බෙදාහැරීම මෙන් ම නව සිරකරුවන් සඳහා වූ අනුස්ථාපන වැඩසටහන්වලට පුස්තකාල කාර්ය මණ්ඩලය සහභාගී වීම ආදිය වේ.

10.7 පුස්තකාලයේ අනුග්‍රහයෙන් පැවැත්වෙන ක්‍රියාකාරකම්වලට අමතරව (9.3 බලන්න) කාර්ය මණ්ඩලය සහ පුස්තකාලයේ වැඩ කරන රැඳවියන්ට පහත සඳහන් දෑ පිළියෙල කළ හැකි වේ.

- විෂයයන් පිළිබඳ ග්‍රන්ථ නාමාවලිය
- නව ප්‍රතිග්‍රහණ ලැයිස්තුව
- ගවේෂණ හා පොත් සලකුණු
- පොත් සහ චිත්‍ර ප්‍රදර්ශන

10.8 පුස්තකාලය, ප්‍රජා සමාජ සේවා ප්‍රකාශන බෙදාහැරීමේ කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් ලෙස සේවය කිරීමෙන් හා බාහිර සහායක - ආධාරක සංවිධානවලට යොමු කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීමෙන් පුස්තකාලයට පුද්ගලයින් පැමිණෙන වාර ප්‍රමාණය වැඩි කර ගත හැකි වේ.

## ශබ්ද මාලාව

**මෙහි නිර්වචනය කර ඇති පරිදි සහ විස්තර කර ඇති සන්දර්භය තුළ පහත දැක්වෙන පද හා වාක්‍ය ඛණ්ඩ මෙම ලේඛනයේදී භාවිතයට ගැනේ.**

**ප්‍රවේශය :** (Access) තොරතුරු, පුස්තකාල ද්‍රව්‍ය හා සේවා ලබාගැනීම හා භාවිතා කිරීමට ඇති නිදහස සහ හැකියාව

**නියෝජිතායතනය :** (Agency) නීත්‍යානුකූල අත්අඩංගුවේ සිටින පුද්ගලයින්ට පුස්තකාල සේවා සපයන රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයකි/පද්ධතියකි

**විශාල අකුරුවලින් මුද්‍රිත පොත්/ප්‍රකාශන :** (Large Print Books/ Publication) පොයින්ට් 14 හෝ ඊට වැඩි ප්‍රමාණයේ අකුරුවලින් මුද්‍රණය කළ ද්‍රව්‍ය

**බන්ධනාගාර :** (Prison) පුද්ගලයින් අත්අඩංගුවේ රඳවා තබා ගැනීම, සිරගත කිරීම හෝ රඳවා තබා ගැනීමේ ඕනෑම ආයතනයක්/ස්ථානයක්, දඬුවම් කිරීම, දණ්ඩනීය ආයතනය, බන්ධනාගාර හෝ නිවැරදි කිරීමේ ආයතනය ලෙස ද හැඳින්වේ.

**බන්ධනාගාර අධිකාරිය :** (Prison Authority) බන්ධනාගාර පහසුකම් පවත්වා ගෙන යන ජාතික හෝ පළාත් පාලන දෙපාර්තමේන්තුව

**වෙන් කිරීම/වෙන් කළ තත්වය :** (Segregation/Segregated status) කාර්ය මණ්ඩලය සහ අනෙකුත් රැඳවියන්ගේ ආරක්ෂාව, ආයතනයේ ආරක්ෂාව හෝ දඬුවම් සඳහා රැඳවියන් භෞතික වශයෙන් වෙන් කිරීම.

**චන්ද්‍රිකා පුස්තකාලය :** (Satellite Library) ප්‍රධාන පුස්තකාලයේ කාර්ය මණ්ඩලය විසින් අධීක්ෂණය කරනු ලබන බන්ධනාගාර සංකීර්ණයේ පිහිටි අනුබද්ධ පුස්තකාලයක් හෝ ශාඛාවකි. මෙය, ප්‍රධාන පුස්තකාලයට වඩා කුඩා වන අතර බොහෝ විට සීමිත කොටසක (උදා. සිර මැදිරි, පාසල, රෝහල) පිහිටා ඇත.

**පරිශීලක :** (User/Patron) පුස්තකාලය භාවිතා කරන පුද්ගලයෙකි.

# ග්‍රන්ථ නාමාවලිය

## PRISON LIBRARIES: STANDARDS, GUIDELINES AND RELEVANT LITERATURE, 1990-2005

ABM-Utvikling. (2005). Bibioteket: det normale rommet I fengslet. (skrift #14). Oslo: ABM. http://www.abm-utvikling.no/publisert/ABMskrift/2005/fengselsbibliotek_web.pdf

American Association of Law Libraries. Contemporary Social Problems and Special Interest Section. (1996). Recommended collections for prison and other institution law libraries. (Rev. ed.). Chicago, IL: American Association of Law Libraries.

American Association of Law Libraries. Standing Committee on Law Library Service to Institution Residents. (1991). Correctional facility law libraries: An A to Z resource guide. Laurel, MD: American Correctional Association.

American Correctional Association. (1991). Standards for adult local detention facilities. (3rd ed.). College Park, MD: American Correctional Association.

American Correctional Association. (2003). Standards for adult correctional institutions. (4th ed.). Lanham, MD: American Correctional Association.

Anderson, W. (1991). The evolution of library and information services for special groups: The role of performance review and the user. IFLA Journal, 17(2), 135-141.

Arlt, J. (1999). Neue Wege für die Brandenburger Gefangnisbibliotheken [New ways for the Brandenburg prison libraries]. Buch und Bibliothek, 51(7/8), 494-496.

Association of Specialized and Cooperative Library Agencies. (1992). Library Standards for Adult Correctional Institutions, 1992. Chicago, IL: American Library Association.

Association of Specialized and Cooperative Library Agencies. (1999). Library Standards for Juvenile Correctional Facilities. Chicago, IL: American Library Association.

Australian Library and Information Association. (1990). Australian prison libraries: Minimum standard guidelines. Canberra, Australia: Australian Library and Information Association.

Bibliotek innanför murarna. [Libraries behind bars]. (2002). Biblioteksbladet, 87(2), 2-11.

Bowden, T.S. (2003). A Snapshot of state prison libraries with a focus on technology. Behavioral and Social Sciences Librarian, 21(2), 1-12.

Buck, D., Ingham, D., Valentine, P., Thompson, M., Jones, P., & Darbishire, B. (1992). Prison libraries in Norfolk: A review. Norwich: Norwich City College Library.

Contini, C. (2003). Biblioteche scatenate: Biblioteca, carcere e territorio. Atti del convegno nazionale, Sassari, Camera di commercio, 28-29 marzo 2003. Rome: Associazione italiana biblioteche (AIB), Sezione Sardegna.

Costanzo, E., & Montechi, G. (2002). Liberi di leggere: Lettura, biblioteche carcerarie, territorio. Atti del Convegno, Rozzano (MI). Centro culturale Cascina Grande, 11 maggio 2001. Rome: Associazione italiana biblioteche (AIB).

Council of Europe. (1990). Education in prison. Strasbourg, GR: Council of Europe. (pp. 41-44, Recommendation No. R(89) 12 adopted by the Committee of Ministers of the Council of Europe on 13 October 1989 and explanatory memorandum).

Council of Europe. (1990). Final activity report on prison education. Strasbourg, GR: Council of Europe.

Crowell, J. R. (1996). Correctional Law Libraries: Operations, Standards and Case Law. Littleton, CO: F. B. Rothman.

Curry, A., Wolf, K., Boutilier, S., & Chan, H. (2003). Canadian federal prison libraries: A national survey. Journal of Librarianship and Information Science, 35(3), 141-152.

Darby, L.T. (2004). Libraries in the American Penal System. Rural Libraries, 24(2), 7-20.

De Carolis, E. (2000). Diritto di lettura: l'esperienza della biblioteca carceraria [The right to read: The experience of prison libraries]. Bollettino AIB, 40, (3), 347-363.

Desmond, Y. (1991). Recreation and education: A combined approach in Wheatfield Place of Detention, Dublin. An Leabharlann, 7(4), 127-135.

Fabiani, J-L., & Soldini, F. (1995). Lire en prison: Une étude sociologique. Paris: Bibliothèque publique d'information.

Fédération Française pour la Coopération des Bibliothèques (FFCBmld), Coopération des bibliothèques en Aquitaine (CBA). (1997). Bibliothèque & lecture en prison: Guide à l'usage du détenu auxiliaire de bibliothèque. Paris.

Fédération Française pour la Coopération des Bibliothèques (FFCBmld). (2004). Les actions culturelles et artistiques en milieu pénitentiaire, Paris.

Fernandez, C. M. (1991). Servicos bibliotecarios en las carceles de Barcelona y provincia [Prison library services in Barcelona province]. Boletin de la Asociacion Andaluza de Bibliotecarios, 7(23), 15-28.

Flageat, M. C. (1998). Un exemple d'intervention de bibliothécaires en prison: la maison d'arrêt des Yvelines [An example of librarian intervention in prison: The Yvelines remand centre]. Bulletin d'Informations de l'Association des Bibliothécaires Français. (181), 36-40.

Franzén, Gunilla. Det svenska fengelsebiblioteket. Eskilstuna, Sweden: Eskilstuna stads – och länsbibliotek, 1996.

Fridriksdottir, B. (1995). Bokasafnspjonusta fyrir fanga a Islandi [Library services to Icelandic prisoners]. Bokasafnid, (19), 91-92.

Galler, A. M., & Locke, J. (1991). L'état des bibliothèques dans les pénitenciers féderaux du Québec [The state of libraries in the federal prisons of Québec]. Argus, 20(1), 27-33.

Golay, A. (1990). Une bibliothèque ordinaire dans un cadre extraordinaire: la bibliothèque de la Prison de Champ-Dollon (Genève) [An ordinary library in an extraordinary setting: The library of the Champ-Dollon Prison in Geneva]. ArbiDo-Revue, 5(3), 84-89.

Great Britain. Standing Committee on Prison Libraries. [1991-1993]. Prison libraries: Roles and responsibilities. [London]: Home Office, HM Prison Service.

Hugo, N. (1996). Library services to prisoners in South Africa: Their contribution towards rehabilitation and improving the quality of inmates' lives. KWAZNAPLIS, 2(3), 3-6.

IFLA/UNESCO public library manifesto. (1995). The Hague: IFLA. International Book Committee, & International Publishers Association. (1994). Charter for the reader. Geneva: UNESCO.

Irvall, B., & Nielsen, G.S. (2005). Access to libraries for persons with disabilities. (IFLA Professional Report no. 89). The Hague: IFLA.). http://www.ifla.org/VII/s9/nd1/iflapr-89e.pdf

Janos, J. (2003). Prison libraries. KNIZNICA, 4(5), 235-239.

Jones, M. D. (1994). Information Needs of African Americans in the Prison System. In E. J. Josey (Ed.), The Black Librarian in America Revisited. Metuchen, NJ: Scarecrow Press.

Kaiser, F. E. (Ed.). (1992). Guidelines for library services to prisoners. (IFLA Professional Report no. 34). The Hague: IFLA.

Kaiser, F. E. (1993). De bibliotheek achter tralies: bibliotheekwerk in gevangenissen,

huizen van bewaring, inrichtingen voor ter beschikking gestelden en jeugdinrichtingen [The library behind bars: Library services in prisons, detention centres and young offenders' remand institutions]. Open, 25(3), 94100.

Kaiser, F. E. (1993). Guidelines for library services to prisons. IFLA Journal, 19(1), 67-73.

Kaiser, F. E. (Ed.). (1993). Pautas para servicios bibliotecarios para prisioneros. (IFLA Professional Report no. 37). The Hague: IFLA.

Kaiser, F. E. (Ed.). (1995). Guidelines for library services to prisoners. (2nd rev. ed.). (IFLA Professional Report no. 46). The Hague: IFLA.

Kaiser, F. E. (Ed.). (1995). Richtlinien zur Bibliotheksversorgung von Häftlingen. (IFLA Professional Report no. 47). The Hague: IFLA.

Lehmann, V. (2000). Prison librarians needed: A challenging career for those with the right professional and human skills. IFLA Journal, 26(2), 123-128. http://www.ifla.org/IV/ifla65/papers/046-132e.htm

Lehmann, V. (2000). The Prison Library: A Vital Link to Education, Rehabilitation, and Recreation. Education Libraries, 24(1), 5-10.

Lehmann, V. (2003). Planning and implementing prison libraries: Strategies and resources. IFLA Journal, 29(4), 301-307.
http://www.ifla.org/IV/ifla69/papers/175-E_Lehmann.pdf

The Library Association. Prison Libraries Group. (1997). Guidelines for prison libraries (2nd ed.). London: Library Association.

Lieber, C., & Chavigny, D. (2005). Les bibliothèques des établissements penitentiaries. Rapport au Ministre de la culture et de la communication. France. http://www.culture.gouv.fr/culture/actualites/index-rapports.htm

Liggett, J. M. (1996). Survey of Ohio's prison libraries. Journal of Interlibrary Loan, Document Delivery and Information Supply, 7(1), 31-45.

Lire & écrire en prison: La Presse: colloque, Bordeaux, 8 octobre 1993. (1995). Bordeaux: Coopération des bibliothèques en Aquitaine.

Lithgow, S., & Hepworth, J. B. (1993). Performance measurement in prison libraries: Research methods, problems and perspectives. Journal of Librarianship and Information Science, 25(2), 61-69.

Lucas, L. (1990). Educating prison librarians. Journal of Education for Library and Information Science, 30(3), 218-225.

Nyeng, P. (1998). Library days behind bars. Scandinavian Public Library Quarterly, 31(1), 8-11.

Ostlie, Jan-Erik. (1999). Verdens beste fengselsbibliotek. [The world's best prison library]. Bok og Bibliotek, 66(1), 15-17.

Peschers, G. (1999). Weiterentwicklung der Bibliotheksarbeit im Justizvollzug in NRW. Buch und Bibliotheck, 51(4), 254-256.

Peschers, G. (2003). Bibliotheksarbeit im Justizvollzug in Deutschland am Beispiel Nordrhein-Westfalens: Gefangenenbibliotheken als Portale begrenzter Freiheit zur sinnvollen Freizeitgestaltung für Inhaftierte. WLIC 2003.
http://www.ifla.org/IV/ifla69/papers/023g-Peschers.pdf

Peschers, G., & Skopp, K. J. (1994). Nordrhein-Westfalen: Bibliotheksarbeit im Strafvollzug [North Rhine-Westphalia: Library service in the prisons]. Buch und Bibliothek, 46(3), 256-262.

Revelli, C. (1996). Biblioteche carcerarie [Prison libraries]. Biblioteche Oggi, 14(7), 42-46.

Rubin, R. J., & Suvak, D. (Eds.) (1995). Libraries Inside: A Practical Guide for Prison Librarians. Jefferson, NC: McFarland.

Suvak, D. The prison community.
Rubin, R. J. The planning process.
Souza, S. The professional staff.
Mallinger, S. M. The inmate staff.
Reese, D. Collection development.
Rubin, R. J., & Suvak, D. Services.
Pitts, N. Programs.
Piascik, A. Literacy.
Suvak, D. Budgeting.
Brown, T. The facility and equipment.
Lehmann, V. Automation.
Ihrig, J. Providing legal access.

Ruebens, G., & Jacobs, R. (1999). Gevangenisbibliotheken: een pilootproject in Brugge [Prison libraries: A pilot project in Bruges]. Bibliotheek en Archiefgids, 75(1), 33-45.

A Sentence to read: A review of library services to penal establishments in Nottinghamshire. (1990). Nottingham, England: Nottingham County Council.

Stearns, R. M. (2004). The Prison library: An issue for corrections, or a correct solution for its issues? Behavioral & Social Sciences Librarian, 23(1), 49-80.

Stevens, T., & Usherwood, B. (1995). The development of the prison library and its rule within the models of rehabilitation. Howard Journal of Criminal Justice, 34(1), 45-63.

Tabet, C. (2004). La bibliothèque hors les murs. Paris: Cercle de la librairie.

United Nations standard minimal rules for the treatment of prisoners. (1995). New York: United Nations.

Vogel, B. (1995). Down for the Count: A Prison Library Handbook. Metuchen, NJ: Scarecrow Press.

Vreeburg, K. (1996). Filiaal zonder collectives: Penitentiaire inrichting besteedt bibliotheekwerk uit aan OB Lelystad [A branch without collections: A prison service provides work for Lelystad Public Library]. Bibliotheek en Samenleving, 24(3), 15-20.

Werner's Manual for Prison Law Libraries. 2004). R. Trammell (Ed.). (3rd ed.). American Association of Law Libraries Publications Series; no. 69). Buffalo, NY: Wm. S. Hein.

Westwood, K. (1998) "Meaningful access to the courts" and law libraries: Where are we now? Law Library Journal, 90(2), 193-207.

Wilhelmus, D. W. (1999). A new emphasis for correctional facilities' libraries: college programs in prison systems. The Journal of Academic Librarianship, 25(2), 114-120.

Womboh, B. S. H. (1991). Nigerian prison library services: Status and needs. Focus on International & Comparative Librarianship, 22(1), 10-15.

Womboh, B. S. H. (1995). Research summary: An assessment of Nigerian prison libraries. Third World Libraries, 5(2), 74-75.

Yamaguchi, A. (2002). Books for prisoners. Toshokan Zasshi (The Library Journal), 96, 761-763.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක: 14, නිදහස් මාවත,
කොළඹ 07.
0112 698847 | 0112 685197
www.natlib.lk

ISBN 978-955-7544-35-9
9 789557 544359

රු. 250/-